3345
4238
දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/04-01-63/03/2013

ඔබේ අංකය
உமது இல.
Your No.
MOJ/E08/01/LDD/09/2015

දිනය
திகதி
Date
2022.10. 20

RECEIVED
27 OCT 2022
Postal Section
Ministry of Justice

10/31

ලේකම්

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ පුරප්පාඩු පිරවීම - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2022.09.05 දිනැති ලිපිය හා බැඳේ.

02. යොමුගත ලිපියේ සඳහන් කරුණු සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 2013.12.12 දින මෙම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද නීතිපති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නීති කෙටුම්පත් සම්පාදක සේවය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සඳහා මෙහි ඇමුණුම 1 හි සඳහන් සංශෝධනයන් ඇතුළත් කිරීමට 2022.10.18 දින අනුමැතිය ලබා දී ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධන ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ටී.ඩබ්ලිව්. ගයාන්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්

I. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව
II. නීති කෙටුම්පත් සම්පාදක, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
III. ආයතන අධ්‍යක්ෂ ජනරාල්

} - කරු. දැ.ගැ.ස.

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි**

**නීති කෙටුම්පත් සම්පාදක සේවය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය**

**03 වන සංශෝධනය**

| අනු අංකය | වගන්තිය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 01 | 10.1.2 | උසස් කිරීමේ ක්‍රමය<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් හා වෙනත් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක නිලධාරීන්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සේවා පළපුරුද්ද හා කාර්යසාධන ඇගයීම් සැලකිල්ලට ගනිමින් එම මණ්ඩලයේ නිර්දේශ මත, සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සහ පවතින පුරප්පාඩු අනුව ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. |
| 02 | 10.2.2 | උසස් කිරීමේ ක්‍රමය<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් හා වෙනත් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක නිලධාරීන්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සේවා පළපුරුද්ද හා කාර්යසාධන ඇගයීම් සැලකිල්ලට ගනිමින් එම මණ්ඩලයේ නිර්දේශ මත, සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සහ පවතින පුරප්පාඩු අනුව නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක තනතුරට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. |